// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2394/22 – 2024 ජූලි මස 23 වැනි අඟහරුවාදා – 2024.07.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුළුපිටිය 78-J ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බදුළුපිටිය කොට්ඨාස අංක - 8 මල්වත්ත (බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ACQ/ BDL/2016/66 හා 2017.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – මුදුන්පිට මගුල්ලියද්ද – **ප්‍රමාණය: හෙක්. 0.0665**

උතුරට: රඹුක්පොත රජමහා විහාරය හිමිකම් කියන මුදුන්පිට මගුල්ලියද්ද; නැගෙනහිරට: රඹුක්පොත රජමහා විහාරය හිමිකම් කියන මුදුන්පිට මගුල්ලියද්ද සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය සහ රඹුක්පොත රජමහා විහාරය හිමිකම් කියන මුදුන්පිට මගුල්ලියද්ද.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2015/LO/21.
2023 ඔක්තෝබර් මස 30 වැනි දින.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 – 0214

1A – G 042284 – 19 (2024/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*